දිවයින
2020/03/01
පිටු අංක 01/12

# මාස තුනට උද්ධමනය සියයට 3 කින් ඉහළ ගිහින්

## එජාප පාර්ලිමේන්තු මන්ත්‍රී ඉරාන් වික්‍රමරත්න

අකිත පෙරේරා

මාස තුනක් ඇතුළත රටේ උද්ධමනය සියයට තුනකින් ඉහළ ගොස් ඇතැයි එක්සත් ජාතික පක්ෂ පාර්ලිමේන්තු මන්ත්‍රී ඉරාන් වික්‍රමරත්න මහතා 'දිවයින ඉරිදා සංග්‍රහය'ට පැවසීය. පිටුව 12

## මාස තුනට...

උද්ධමනය ඉකුත් වසරේ (2019) නොවැම්බර් මාසයේ සියයට හතරක්ව පැවතිය ද මේ වසරේ (2020) පෙබරවාරි මාසය වන විට 7.6 ක් දක්වා ඉහළ ගොස් ඇතැයි ද ඒ මහතා සඳහන් කළේය.

ආහාර ද්‍රව්‍යවල මිල ගණන් මේ වන විට ශීඝ්‍රයෙන් වැඩිවී තිබෙන අතර විශේෂයෙන් එළවළු මිල ද විශාල වශයෙන් මේ වන විට ඉහළ යෑම උද්ධමනයට බලපා ඇතැයි ද හෙතෙම පැවසීය.

මීට අමතරව පොලී අනුපාත ද තරමක් ඉහළ ගොස් ඇතැයි ද එය ආණ්ඩුව විසින් නිර්මාණය කරගත් ගැටලුවක් බව ද සඳහන් කළේය. පැවති රජය 2015 සිට 2019 දක්වා රජයේ ආදායම දෙගුණයක් කොට රටේ මූල්‍යමය විනය ඇති කළේ ද වත්මන් ආණ්ඩුවට එවැනි වැඩපිළිවෙළක් නැතැයි ද ඉරාන් වික්‍රමරත්න මහතා චෝදනා කළේය.